# උත්තරිමනුස්සධම්ම පිළිබඳ ව ලාංකේය භික්ෂු සම්ප්‍රදායේ නූතන මතවාද

වැලිවිට සොරත හිමි

## ආරම්භය

ක්‍රි. පූ. 6 වන සියවසේ දී ආරම්භ වු බුදුදහමේ පරම නිෂ්ඨාව වන්නේ දුකින් එතෙර වී නිවන් අවබෝධ කර ගැනීමයි. ඒ සඳහා ක්‍රම පිළිවෙළ තුනකි. එනම් බුදු, පසේ බුදු හා මහරහත් යන ඒවාය. එම තත්වයන්ට පත් නොවන සෑම කෙනෙක් ම අයත් වන්නේ ධ්‍යානලාභී, සෝවාන් සකදාගාමි අනාගාමි හා පෘථග්ජන වශයෙනි. පෘථග්ජන යන නාමය හැරුණු විට අනෙක් පුද්ගලයන් සියලු දෙනා සාමාන්‍ය මිනිස් බව ඉක්මවා ගිය තැනැත්තෝ වෙති. ඔවුන්ට සාමාන්‍ය මිනිසුන්ට වඩා යම් දෙයක් කිරීම සිතීම හෝ දැනීමේ ශක්‍යතාව ඇත. යම් කෙනෙක් පෘථග්ජන ස්වභාවයේ සිටිමින් ඉන් ඔබ්බට ගොස් තමන් ළඟ නොමැති යම් දෙයක් පෙන්වමින් ක්‍රියා කරන්නේ නම් ඔහු හෝ ඇය බුදුදහමේ පෙන්වා දෙන මාර්ගයේ ගමන් කරන පුද්ගලයෙක් නොවන්නේය. පෘථග්ජන තත්ත්වයෙන් ඉහළට ගොස් ධ්‍යානයක් ලබා ගැනීමත් එය ආරක්ෂා කර ගැනීමත් තරමක් අපහසුය. ධ්‍යාන ලැබූ පුද්ගලයෙක් තමන් විසින් සිදු කරනු ලබන යම් යම් ක්‍රියාවන් හේතුකොටගෙන ඒ තත්ත්වයෙන් පිරිහීමේ ඉඩ ප්‍රස්තාව බොහෝය. බුදුදහම අනුග මනය කරන පිරිසට මෙවැනි තත්ත්වයන් ලබා ගැනීමට හැකිවා සේම මේ සියලු පුද්ගලයන් බුදුදහමේ හඳුන්වා දෙන්නේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසක් වශයෙනි. සම්බුදු සසුනට ඇතුළත් වූ අය ආර්ය ශ්‍රාවක යන එක් පොදු නාමයකින් ද හඳුන්වනු ලැබේ. බුද්ධ දේශනාවට අනුව එම තත්ත්වය ලබා ගැනීම ද අතිශයින් දුෂ්කරය.

යම් කලෙක ආර්ය ශ්‍රාවක තෙමේ අකුසලය මෙන්ම අකුසල හටගන්නා තැන දනීද, කුසලය මෙන්ම කුසලය හටගන්නා

තැන දනීද, ඔහු සියලු ආකාරයෙන් රාගය ද්වේෂය දුරුකොට අස්මිමානය හෙවත් ''මම ය මාගේය'' යන සංකල්ප බැහැර කරන්නේ මානය නැතිකොට අවිද්‍යාව හෙවත් චතුරාර්ය සත්‍යය නොදැනීම දුරුකොට එය දැනගන්නේ මෙලොවදීම දුක් කෙළවර කරන්නෙක් වෙයි. එබඳු ආර්ය ශ්‍රාවකයා සියල්ල මනාකොට දක්නේ වෙයි. ඔහුගේ දෘෂ්ටිය ඍජු වන අතර අවෙච්චප්පසාදය හෙවත් ධර්මයෙහි ගුණ දැන පැහැදීමකින් යුක්ත වූයේ වෙයි. මේ නිර්වාණාධිගමයට හේතුවයි.[1]

මෙම දේශනාවට අනුව ආර්ය ශ්‍රාවකයා තුළ මූලික වශයෙන් ඇතිකරගත යුත්තේ අවෙච්චප්පසාදයයි. මෙහි අවෙච්චප්පසාදය යනු සොවාන්, සකදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ග හා ඵල වශයෙන් දැක්වෙන පියවර අට හා නිවන යන නව ලොකුත්තර ධර්මය පිළිබඳ ව මූලික වශයෙන් පැහැදීම ඇති කර ගැනීමත් දෙවනුව රාගය ද්වේශය අකුසලය හා එහි හටගැනීමත්, කුසලය හා කුසලයේ මූලය කුමක්ද යනුවෙන් අවබෝධ කර ගැනීමත්ය. එවිට සම්මා දිට්ඨිය හෙවත් යථාභූත නිවැරදි දැක්ම ඇතිවෙයි. දිට්ඨධම්ම හෙවත් මෙලොවදී ම සත්‍යය අවබෝධ කරගෙන සසර දුකින් එතෙර වීමේ මාර්ගය උපදවා ගන්නා බව බුදුවදනෙහි සඳහන් වේ. එබඳු තැනැත්තා ආර්ය ශ්‍රාවක යන නමින් මේ සසුන තුළ වැජඹෙයි. මෙයින් පෙනෙන්නේ පැහැදීමෙන් හා අවබෝධයෙන් යුක්ත වූ යමෙක් සම්මාදිට්ඨියෙන් යුක්තව අවිද්‍යාව නසා නිවන් මගට එළඹීමට අවශ්‍ය මාර්ගය දැක මෙලොවදීම දුක් කෙළවර කර ගැනීමේ ගමන් මාර්ගය ලෙස ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කළ යුතු බවය. එම ප්‍රතිපදාවේ ගමන් කිරීමෙන් හා එය ප්‍රත්‍යක්ෂීකරණය කිරීම බුදුදහමේ කේන්ද්‍රීය ඉගැන්වීමක් ලෙසින් පෙන්වා දීම එහි ඇති විශේෂතාවයි.

මෙම ගමන් මාර්ගය අනුගමනය කිරීමේ දී යම් පිළිවෙළකට අනුව ගමන් කළ යුතු බව බුදුරජාණන් වහන්සේ මජ්ඣිම නිකායේ කීටාගිරි සූත්‍රයේ දී දේශනා කර ඇත.

''මහණෙනි මම පළමු කොටම රහත් බැව්හි පිහිටීම නොකියමි. එතෙකුදු වුවත් අනුපූර්ව ශික්ෂාවෙන්, අනුපූර්ව ක්‍රියාවෙන් අනුපූර්ව ප්‍රතිපදාවෙන් අර්හත්වයෙහි පිහිටීම වෙයි.''

ඒ සඳහා ගමන් කළ යුතු මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එහි ගමන් කිරීමෙන් පළමුවෙන් පුද්ගලයාට ලබා ගත හැකි ප්‍රතිඵලය සෝතාපන්න නම් වෙයි. ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩීමෙන් නිවන් අවබෝධ වන බවට පැහැදිලි දේශනාවක් අඩංගු සූත්‍රයක් ලෙස දීඝනිකායේ මහාලි සූත්‍රය ඉතා වැදගත් වෙයි.

''මහාලි, මේ ධර්මයන්ගේ සාක්ෂාත්කරණය පිණිස එක් මාර්ගයක් ඇත. එක් ප්‍රතිපදාවක් ඇත. එය නම් අර්යඅෂ්ඨාංගික මාර්ගයයි. හෙවත් මධ්‍යම ප්‍රතිපදාවයි.''

මේ පාඨයට අනුව පුද්ගලයාට ධර්මය සාක්ෂාත් කර ගැනීමට හා නිවන් අවබෝධ කිරීමට අවශ්‍ය බුදු, පසේ බුදු හා මහරහත් තත්ත්වයන් ළඟා කර ගැනීමට මූලික වශයෙන් ආර්ය අෂ්ඨාංගික මාර්ගය පිළිබඳ යථාවබෝධය අවශ්‍ය කරන්නේය. යම් කෙනෙක් අර්හත් තත්ත්වයට පැමිණෙන්නේ ද ඒ ධර්ම ප්‍රතිපදාවෙහි හා ආකල්පමය වශයෙන් ඇති කරගන්නා වූ ගති ලක්ෂණ පදනම් කරගෙනය. කිසිවෙක් ධර්ම ප්‍රතිපදාවේ ගමන් නොකරන්නේ නම් හෝ ආකල්පමය වශයෙන් ගති පැවතුම් ගොඩ නගා ගන්නේ නැත්නම් ඒ පුද්ගලයා රහතන් වහන්සේ කෙනෙක් යැයි හඳුන්වා දිය නොහැකිය. ඒ අනුව නිවන සාක්ෂාත් කරගන්නා වූ ක්‍රමවේද දෙකක් බුදුදහමේ පෙන්වා දෙයි.

මහණෙනි නිර්වාණ ධාතුවේ කොටස් දෙකකි. එනම් සඋපදිසෙස හා අනුපදිසේස යනුවෙනි. මෙයින් සඋපදිසේස නිර්වාණ ධාතුව වනාහි කෙලෙස් පරිනිර්වාණයයි. මෙයින් නිවන් අවබෝධ කරගත් තැනැත්තා පංච ඉන්ද්‍රියයන් සහිතව සිටියත් එම තැනැත්තා තුළ ඇති වෙන සියලු ආශ්‍රවයන් ප්‍රහීණ විය යුතුය. බ්‍රහ්මචර්යාවෙහි හැසිර එයින් නිවන් අවබෝධ විය යුතුය. රහත් භාවය උදෙසා කළයුතු යම් කාර්යයක් වේ නම් ඒ සියල්ල අවසන් කර සිටිය යුතුය. තම ආධ්‍යාත්මයෙහි පවතින කෙළෙස් බර බහා තැබිය යුතුය. යහපත් අර්ථයකින් ගම්‍ය වන නිවනට පැමිණිය යුතුය. ක්ෂය කරන ලද දස සංයෝජන ධර්මයන් තිබිය යුතුය. සියල්ල දැනගෙන මිඳුණු පුද්ගලයෙක් බවට පත් විය යුතුය. අනුපදිසේස නිර්වාණය වනාහි රූප, වේදනා, සංඥා, සංඛාර හා විඥ්ඥාණ යන ස්කන්ධ පරිනිර්වාණයයි.

මේ අනුව රහත් බව යන්න කෙනෙකුට ලෙහෙසියෙන් ළඟා කර ගත හැකි දෙයක් නොවේ. ධර්මය දැනගෙන සිටි පමණින් රහතන් වහන්සේ කෙනෙක් නොවේ. එසේනම් එහි ප්‍රධානියා විය යුත්තේ බුද්ධෝපස්ථායක ආනන්ද හිමියන් ය. මන්දයත් උන්වහන්සේ බුදුරජුන් දේශනා කළ සියලු ධර්මයන් සිත් හි දරාගෙන සිටි කෙනාය. යම් ධර්ම කරුණක් සම්බන්ධයෙන් විමසීමක් කළේ නම් එහි ආදීනවය මෙන් ම නිස්සරණය ද මනාකොට වටහා දීමට ආනන්ද හිමියන් දැන සිටියේය. එහෙත් උන්වහන්සේ පෘථග්ජන කෙනෙකි. වරක් ආනන්ද හිමියන් බුදුරජුන් හමුවේ ප්‍රකාශ කර සිටියේ

''ස්වාමිනි බුද්ධ දේශිත පටිච්චසමුප්පාදය ආශ්චර්ය. අද්භූතය. මේ පටිච්චසමුප්පාදය ගැඹුරුය, ගැඹුරු බැසගැනීම් ඇත්තේය. එහෙත් මට එය පැහැදිලි වූවක් මෙන් මැනවින් වැටහේය.''

ඉහත ප්‍රකාශය සැරියුත් හිමියන් හෝ මුගලන් හිමියන් වැනි රහත් තෙර නමක් ප්‍රකාශ කළේනම් ඒ පිළිබඳ සැකයක් නැත. මන්දයත් පටිච්චසමුප්පාද ධර්මය අවබෝධ කරගෙන රහත් තත්ත්වයට පත් උතුමන් වූයේ ඔවුන්ය. එහෙත් ආනන්ද හිමියන්ගේ මෙම ප්‍රකාශයත් සමග බුදුරජුන් දේශනා කරන්නේ ''ආනන්දය එසේ නොකියන්න. ආනන්දය එසේ නොකියන්න. මේ පටිච්චසමුප්පාදය ගැඹුරුය ගැඹුරු බැසගැනීම් ඇත්තේය. මෙම පටිච්චසමුප්පාදය නොදන්නා කම නිසා සියලු ප්‍රජාවෝ නූල් පන්දුවක් මෙන් කුරුළු කූඩයක් මෙන් බුබුස් තණයක් මෙන් (සැවැන්දරා මුලක්) අවුලෙන් අවුලට පත්ව සිටින්නාහ.''

මෙම ප්‍රකාශය තුළින් පටිච්චසමුප්පාදය නොදන්නා කම කිසිදු මාර්ග ඵලයක් අවබෝධ කරගැනීමට හැකියාවක් නොමැති බව පෙන්වා දෙයි. යම් කෙනෙක් පටිච්චසමුප්පාදය අවබෝධ කර ගත්තේනම් ඔහු රහත් තත්ත්වය අවබෝධ කරගත යුතුය. අවම වශයෙන් සෝවාන් තත්ත්වය හෝ ළඟා කරගත යුතු වේ. උපතිස්ස පරිබ්‍රාජකයා විසින් බුදුරජුන්ගේ ධර්මය කුමක්දැයි විමසූ අවස්ථාවේ අස්සජි හිමියන් විසින් ප්‍රකාශ කරන්නේද හේතුඵල ධර්මයයි. එය ඇසූ විගස වහා ධර්මය අවබෝධ කරගත් උපතිස්ස පරිබ්‍රාජකයා සෝවාන් තත්ත්වයට පත්විය.

අනෙක් පසෙකින් ගත්කළ රහත්භාවය අපේක්ෂා කරන භාවනානුයෝගියෙකුට අනුපිළිවෙළින් ලැබිය යුතු සෝවාන් සකදාගාමි අනාගාමි තත්ත්වයන් ලබා ගැනීමේදී ද ප්‍රහීණ කළයුතු ධර්මයන් රාශියක් ඇත. ඒවා සියල්ල දස සංයෝජන ධර්ම යනුවෙන් හඳුන්වනු ලැබේ.

''මහණෙනි මේ සංයෝජන දසයෙකි. කවර දසයක්ද? ඕරම්භාගිය සංයෝජන පස ද උද්ධම්භාගිය සංයෝජන පස ද යන මේවායි. ඔරම්භාගිය පස කවරේද? සක්කායදිට්ඨි, විචිකිච්ඡා සීලබ්බතපරාමාස, කාමරාග, ව්‍යාපාද යන ඒවාය. උද්ධම්භාගිය සංයෝජන පස කවරේද? රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ඡ, අවිජ්ජා යන ඒවාය.''

ඉහතින් සඳහන් කළ සංයෝජන ධර්ම අතරින් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන තුන ප්‍රහීණ කිරීමෙන් සෝතාපන්න භාවයට පත්විය හැකිය. සක්කායදිට්ඨිය මිත්‍යා දෘෂ්ටියකි. සෑම දෙයක් පිළිබඳ ව ම වැරදි දැකීමක් තිබේනම් එහි ප්‍රතිඵලය ද වැරදිය. එයින් තොර වූ සම්මාදිට්ඨි හෙවත් යහපත් දැකීම ඇතිකර ගැනීමෙන් සෝවාන් තත්ත්වය අවබෝධ කර ගැනීමට එක් පියවරක් තැබුවේ වෙයි. විචිකිච්ඡා යනුවෙන් අදහස් වන්නේ බුද්ධ, ධම්ම, සංඝ, ශික්ෂාපද, පෙර භවය පිළිබඳ, මතු භවය පිළිබඳ, පෙර හා මතු භවයන් පිළිබඳ හා පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳ යන අට තැන්හි සැකය උපදවා ගැනීමයි. මෙයින් මුල් සතර නිර්වාණගාමී පුද්ගලයින් පිළිබඳ වත් අවසන් හතර භවගාමීත්වය පිළිබඳවත් ඇති වන සැකයකි. ඒ අනුව විචිකිච්ඡාව ද සසර අහුරා තබන අකුසල් ධර්මයන්ය. ඒවා දුරු කිරීමෙන් සෝවාන් තත්ත්වය අවබෝධ කර ගැනීමට හැකිය. සීලබ්බතපරාමාස යනු විවිධ ආකාරයේ සීලයන් පිළිබඳ සොයමින් ඒවායෙහි අන්තයට ගොස් සත්‍යය කුමක්දැයි හරිහැටි අවබෝධ කර නොගැනීමයි. භාරතීය සමාජයේ අජ ව්‍රත (එළුවන් මෙන් හැසිරිම) ගො ව්‍රත (ගවයින් සේ හැසිරීම) සුනඛ ව්‍රත (බල්ලන් මෙන් හැසිරීම) පදනම් කරගෙන සීල ව්‍රත සමාදන් වූ බොහෝ පිරිස් සිටියහ. ඒ කිසිදු සීලයකින්වත් සත්‍යය කුමක්දැයි වටහාගැනීමට කිසිවෙකුටත් නොහැකි විය. එබැවින් මෙය ද සසර

බැඳ තබන අකුසල ධර්මයකි. මෙකී සංයෝජන ධර්ම ප්‍රහාණය කිරීමෙන් සෝවාන් තත්ත්වය අවබෝධ කර ගත හැකිය.

සෝවාන් තත්ත්වයට පත් පුද්ගලයාට කාමරාග හෙවත් ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංච ඉන්ද්‍රියයන් මගින් ලබන්නා වූ ආශාවන් පිළිබඳ ඇලීම දුරු කිරීමෙන් ද, ව්‍යාපාද හෙවත් සුළු දෙයටත් ක්‍රෝධය වෛරය තරහව උපදවා ගැනීම අත්හැරීමෙන් ද සකදාගාමි තත්ත්වයට පත්විය හැකිය.

ඕරම්භාගිය සංයෝජන ධර්ම දුරු කළ තැනැත්තා සුද්ධාවාස ආදි බ්‍රහ්මලෝකවල උප්පත්තිය ලැබීමට හේතුවෙයි. ඔවුන් නැවත මේ සසරට පැමිණෙන්නේ නැත. උද්ධම්භාගිය සංයෝජන ධර්ම එවැනි බඹතලවල ම වසමින් දුරු කෙරේ. මුල් ඕරම්භාගිය සංයෝජන ධර්ම පහ ප්‍රහාණය කිරීම අපහසු වන අතර අනෙක් ඒවා පිළිබඳ ඒ ඒ බඹතලවල වසමින් අවබෝධය ලබාගැනීමෙන් දුරු කිරීම පහසුය. ඒ අනුව දස සංයෝජන ධර්ම අතරින් ඕරම්භාගිය සංයෝජන දුරු කිරීම සෝතාපන්න හා සකදාගාමි තත්ත්වයට පත් වීමටත්, අනාගාමි හෙවත් නැවත කාම ලෝකවලට නොපැමිණ අර්හත් භාවයට පත්වීමටත් හැකිය.

මෙසේ යම් මාර්ග ඵලයක් ලැබීම හෝ ඒ සඳහා උත්සහ කරන ලද්දා වූ බොහෝ දෙනා පිළිබඳ තොරතුරු මුල් බුදුසමය තුළින් දැක ගත හැකිය. දේවදත්ත වැනි අගතිගාමි පුද්ගලයින් බුද්ධ දේශනා ප්‍රතික්ෂ්ප කරමින් වෙනත් මාර්ගයක ගමන් කළ පිරිසක් ද විය. එවැනි පුද්ගලයින්ට අවසානයේ ලැබුනේ ඊළඟ භවයේ දී අපායගාමි පුද්ගලයින් බවට පත්වන්නටය. එසේ තමන් සන්තකයේ නොපැවැතුන ධ්‍යානයක් හෝ මාර්ග ඵලයක් ප්‍රකාශ කිරීම හේතු කොටගෙන එවැනි පුද්ගලයින්ට මේ සම්බුද්ධ ශාසනයේ ඇතිවන ප්‍රතිවිපාක මොනවාදැයි යන්න පැහැදිලි කර දීමට බුදුරජුන්ට විනය නීති පනවන්නට ද සිදු වුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපගේ ප්‍රස්තුතයට අදාළ වන ශික්ෂාපදය බරපතල ගණයේ ශික්ෂාපදයක් වශයෙන් පනවන්නට ද යෙදුණි.

''යො පන භික්ඛූ අනභිජානං උත්තරිමනුස්සධම්මං අත්තුපනායිකං අලමරියඤාණදස්සනං සමුදාචරෙය්‍ය. ඉති ජානාමි

ඉති පස්සාමී'ති, තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා ආපන්නෝ විසුද්ධාපෙක්ඛො එවං වදෙය්‍ය. අජානමෙවං ආවුසො අවචං ජානාමි අපස්සං පස්සාමි තුච්ඡං මුසා විලපින්ති අයංම්පි පාරාජිකො හොති අසංවාසො.''

''යම් භික්ෂුවක් තමා නොදන්නා ඉතා උසස් මිනිස් දහම් තමාට ඇති බව අඟවමින් ආර්ය ඥාණයන් ලබා ඇති අයුරින් නිතර සැරිසරමින් ''එය මෙසේ දනිමි. මෙය මෙසේ දකිමියි ප්‍රකාශ කරන්නේ ද එයින් පසුකලෙක කෙනෙකු විසින් ඒ ගැන විමසීමක් ඇතිව හෝ විමසීමකින් තොරව වරදින් මිදීම සඳහා එම භික්ෂුව මෙසේ කියයි ද ''ඇවැත්නි මම නොදැනම දනිමි. නොදැකම දකිමියි කියා හිස් වූ බොරු වූ බස් ප්‍රකාශ කරමින් වෙනත් අයුරින් අධිමානයෙන් තොරව ප්‍රකාශ කරන්නේ ද මෙය ද පරිජි වීමක් වෙයි. භික්ෂු සමාගම තුළ වාසයට නුසුදුසු වන්නේය.''

මෙම සතරවෙනි පාරාජිකාව බුදුරජාණන් වහන්සේ විසින් විශාලා මහනුවර කූටාගාර ශාලාවේ දී පනවා ඇත. වස්කාලයේ භික්ෂූන් වහන්සේලා වස් විසූ වග්ගුමුදා නම් ගමෙහි සේතට්ඨිකා නම් රෝගයක් වපුරා තිබූ ධාන්‍යවලට ඇතිවීම නිසා පිණ්ඩපාතය පවා ලබා ගැනීමට ක්‍රමයක් නොවීය. එවිට භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාත ලබා ගැනීමේ අටියෙන් විවිධාකාර යෝජනා ගෙන ආ අතර ඒ අතරින් ඇතැම් කෙනෙක් ප්‍රකාශ කළේ අපි ගිහියන්ට ඔවුනොවුන් පිළිබඳ උතුරු මිනිස්දම් ගුණ කියා පිණ්ඩපාත ලබමු යනුවෙනි. ඒ අනුව අසවල් භික්ෂුව ප්‍රථමධ්‍යානය අසවල් භික්ෂුව ද්විතියධ්‍යානය ආදි වශයෙන් ධ්‍යාන මෙන්ම සෝවාන්, සකදාගාමි ආදි මාර්ග - ඵල ලබා ඇති බව ද, කීහ. උපාසක උපාසිකාවන් ද මහත් සේ සන්තෝෂයට පැමිණ අපට මහා ලාභයකි. අපට මහා ලාභයකි. මෙබඳු සිල්වත් ගුණවත් ධ්‍යානලාභී භික්ෂූන් වහන්සේලා ලැබීමත් උන්වහන්සේලාට ඇප උපස්ථාන කරන්නට ලැබීමත් මහත් සැබයකැයි කියා තම අඹු දරුවන් ආදීන්ටවත් කිසිවක් නොදී මේ භික්ෂූන් වහන්සේලාට ම සියලු ඇප උපස්ථාන කරමින් සිටියහ. ඒ භික්ෂූන් වහන්සේලා වස් තුන් මාසය මෙසේ වැඩ සිට වස් අවසන් වීමෙන් පසු බුදුරජුන් දැකීම සිරිතක්ව පැවති හෙයින් බුදුරජුන් හමුවීමට පැමිණියහ. බුදුරජහු

ඒ භික්ෂූන් වහන්සේලාගෙන් වස්විසීම, භාවනා කිරීම, සැප දුක් ආදි සියලු තොරතුරු විමසූහ. භික්ෂූන් වහන්සේලා තමන් උතුරුමිනිස් දම් පිළිබඳ කළ ප්‍රකාශ හැර අනෙකුත් තොරතුරු කීහ. බුදුරජුන් ඒ කී සියල්ල සැබෑවක්දැයි විමසූ විට එය සැබෑවක් යැයි කීමට නොහැකි වූ භික්ෂූන් වහන්සේලා තමන් කටයුතු කළ ආකාරය පිළිබඳ සියල්ල ප්‍රකාශ කළහ. එවිට බුදුරජුන් ඒ භික්ෂූන් වහන්සේලාට නොයෙක් ආකාරයෙන් ගර්හා කොට ඉහත ශික්ෂාපදය පනවා වදාළහ.

මෙම ශික්ෂා පදයට අනුව 'අනභිජානං' යන්නෙන් ''තමන් ළඟ නැත්තා වූ එසේ නැතිනම් නොවූ, විද්‍යමාන නොවූ කුසල් දහමක් තමා කෙරෙහි නොදන්නේ, නොදක්නේ මට කුසල් දහම් ඇත්තේයැයි කීමය.''

'උත්තරිමනුස්සධම්ම' යනු ''ධ්‍යාන, විමෝක්ෂ, සමාධි, සමාපත්ති, ඥාණදස්සන, මග්ගභාවනා, ඵලසච්ඡිකිරියා, කිලෙසප්පහාණ, සිත නීවරණයන්ගෙන් තොර බව, ශූන්‍යාගාරයෙහි ඇලීමයි.''

'අත්තූපනායික' යනු ''ඒ කුසල් දහම් හෝ තමා කෙරෙහි ඇතිබව කීමයි. තමා කෙරෙහි හෝ එම කුසල් දහම් පමුණුවීමයි.''

'අලමරියඥාණදස්සන' යන්නෙහි ඥාණය වනාහි ''ආර්යඥාණය ලැබීමෙන් ඇතිවන ත්‍රිවිද්‍යාවයි.'' දස්සන යනු යම් ඥාණයක් වේද ඒ දර්ශනයයි. යම් දර්ශනයක් වේද එය ඥාණයයි.''

ඒ අනුව යම් කෙනෙක් ප්‍රථමධ්‍යානය ආදි ධ්‍යානයක් ලැබුවේ යැයි කියා හෝ රාග, දෝෂ, මෝහයන්ගෙන් තොරවූ ශූන්‍යත විමෝක්ෂය, රාග, දෝෂ, මෝහ නිමිති රහිත බැවින් අනිමිත්ත විමෝක්ෂය, රාග දෝෂ මෝහ ප්‍රනිධි රහිත හෙයි අප්‍රණිහිත මෝක්ෂය දුටුවේ යැයි කියා හෝ ශූන්‍යත, අනිමිත්ත, අප්‍රණීහිත සමාධියක් ලැබුවේ කියා හෝ එවැනි සමාපත්තියක් ලැබුවේ යැයි කියා හෝ සතර සතිපට්ඨාන, සතර සම්‍යක් ප්‍රධාන සතර ඍද්ධිපාද, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොජ්ඣංග, ආර්ය අෂ්ඨාංගික මාර්ග යන මාර්ගයකට පැමිණීමක් හෝ සෝවාන්

සකදාගාමි අනාගාමි, අර්හත් ඵලයක් හෝ ලැබුවේ යැයි කියා හෝ තමන් ලඟ නොමැති යම් අධිමානයක් පදනම් කරගෙන නොදුටු දෙයක් දුටුවේ යැයි කියා හෝ තමන් නොපැමිණුන, අධිගමනය නොකළ දෙයක් අධිගමනය කළේ යැයි කීම හෝ සාක්ෂාත් නොකළ දෙයක් සාක්ෂාත් කළේ යැයි කීම හෝ තවත් කෙනෙකුට ප්‍රකාශ කරන්නේ නම් හෝ රහසිගතව හෝ එවැනි තත්ත්වයකට පත් වූයේ යැයි සිතන්නේ නම් හෝ ඔහු පෙර සිටියාක් මෙන් (ගිහි කාලයේ) භික්ෂුවක් සමග වාසය කිරීමක්වත් භික්ෂු සමාගම තුළ වාසයටවත් නුසුදුස්සෙක් වන්නේය. එය පාපී වූ, ඉච්ඡාභංගත්වය ඇතිකරන, මෙවැනි බරපතල ගණයේ ශික්ෂාපදයක් බුදුරජුන් විසින් පනවා ඇත්තේ බොහෝ හේතු සාධක ඇතිවය. විශේෂිත වූ ධ්‍යාන ලබාගෙන ප්‍රාතිහාර්ය පෑමේ සමත් පුද්ගලයින් බුද්ධකාලීන භාරතයේ සිටියහ. එවැනි තත්ත්වලාභීන් සුළු ධ්‍යානයක් උපදවාගෙන තම ආගමික චින්තනය සංවර්ධනය කිරීමට, පිරිස් බලය වැඩිදියුණු කර ගැනීමට උත්සහ ගෙන ඇත. ඇතැම් ආගමික නායකයින් වටා රොක් වූ බොහෝ පිරිස් තමන්ට දුක් කෙළවර කිරීමට අවස්ථාව තිබිය දී ඒවායින් ඈත් වී මිථ්‍යා අදහස් දරාගෙන කාලය ගත කරමින් සිටියහ. ඇතැම් තවුස් දම් පිරුවන් ගිහියන් ඉදිරියේ දී තමන්ට ඇති සුළු ධ්‍යානයෙන් ඍර්ධි ප්‍රාතිහාර්ය පා ඇත. සම්බුද්ධ ශාසනය තුළ ද මෙවැනි පුද්ගලයින් බොහෝ සෙයින් සිටි බව භාරද්වාජ හිමියන් විසින් දක්වන ලද ප්‍රාතිහාර්ය ආදි අවස්ථාවන් තුළින් පෙන්වා දිය හැකිය. එම නිසාම බුදුරජුන් යම් කෙනෙක් උසස් වූ මිනිස් දම් මාර්ගයෙන් ගිහියන් ඉදිරියේ ඍර්ධි ප්‍රාතිහාර්ය පාන්නේ නම් ඔහුට දුකුළා ඇවැත සිදුවන බව පෙන්වා දෙමින් දුක්කටාපත්තිය පනවා ඇත. ''න භික්ඛවෙ ගිහීනං උත්තරිමනුස්සධම්මං ඉද්ධිපාටිහාරියං දස්සෙතබ්බං. යො දස්සෙය්‍ය ආපත්ති දුක්කටස්සාති''

අතීතයේ පටන් ම මෙම උසස් මිනිස් දම් නැමති පාරාජිකාව මෙන් ම ඊට සමගාමි වූ අනෙකුත් ඇවැත් කඩ කළ භික්ෂූන් වහන්සේලා බොහෝ සෙයින් විද්‍යමානව සිටියහ. වර්තමානය වනවිට මෙම තත්ත්වය වඩාත් බරපතල අන්දමින් සමාජගත වී ඇති බවට සාක්ෂි පෙන්වා දිය හැකිය. වර්තමාන සමාජය තුළ

එවැන්නන් බිහිවීමට ප්‍රධාන වශයෙන් විවිධ හේතු සාධක ඇති බව පෙන්වා දිය හැකිය.

### 1. භාවනා ආයතන බොහෝ සෙයින් ආරම්භ කිරීම

වර්තමානයේ ලෝකය පුරා භාවනාව සම්බන්ධයෙන් විශාල උනන්දුවක් ඇති අතර ලෝකයේ දියුණු රටවල මෙය වඩාත් ප්‍රචලිතව පවතී. මෙවැනි භාවනා ආයතන ආරම්භ කරන පුද්ගලයින් සිදුකරන්නේ බුද්ධ දේශිත නිබ්බානගාමි ප්‍රතිපදාවට වඩා ලාභ අපේක්ෂාවෙන් එවැනි ආයතන පිහිටුවා ගැනීමයි. මෙම ආයතනවලින් බොහෝමයක පොහෝ දින හෝ වේවා අනෙකුත් යොදාගන්නා ලද සුවිශේෂී දිනයන්හි තුන්යම් රාත්‍රිය මුළුල්ලේ සිදුකරන්නේ සම්පූර්ණයෙන් ම භාවනාවයි. එම භාවනා පුහුණුව ලබා දෙන පුද්ගලයාට ඇතැම් විට පැය දෙක තුන එක දිගට නොසෙල් වී සමාධිගතව සිටීමට හැකියාවක් ඇත. ඔවුන් එසේ සිටිමින් සිත යම් මට්ටමකට සමාධිගත කරගෙන විවිධ ක්‍රියාකාකරකම් සිදු කිරීමේ බලයක් උපදවා ගනී. එවිට එම ක්‍රියාවන් බලා සිටින බොහෝ දෙනා ඔහුට මාර්ග ඵලයක් ලබා ඇත්තේ යැයි සිතා ඒ වටා රොක් වෙති.

වර්තමාන ලාංකේය සමාජය තුළ ද හතු පිපෙන්නාක් මෙන් භාවනාව සඳහා ආයතන හා වැඩසටහන් බිහි වේ. එහෙත් ඒවායින් බහුතරයක් බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළ නිවන නැමැති ඉලක්කයට යොමු වී ඇත්දැයි සැක සහිතය. නිවන හුදෙක් ලෝභ, ද්වේෂ, මෝහ ආදි අකුසලයන්ගෙන් විනිර්මුක්ත තණ්හා මාන දිට්ඨි ආදියෙන් තොර වූ සක්කාය දිට්ඨි විචිකිච්ඡා ආදි උද්දම්භාගිය හා ඔරම්භාගිය දස සංයෝජනය ධර්මයන්ගෙන් ප්‍රහීණ වූ, සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා ප්‍රතිපදාව පූරණය කිරීමෙන් ලබන තත්ත්වයකි. නමුත් බිහි වී ඇති බොහෝමයක් භාවනා ආයතන හා එම පුද්ගලයින් තුළ ඉස්මතු වී ක්‍රියාත්මක වන බලාපොරොත්තුව කිසිසේත් නිවන් අරමුණු කරගෙන සිදු වන්නක් නොවේ. ඇතැම් භාවනා ආයතනවලින් පාසල් ළමයෙකුට විභාගය සමත් වීමට ලකුණු ලබා දෙන්නාක් මෙන් තම ශ්‍රාවක යෝගාවචරයින්ට සෝවාන් සකදාගාමි ආදි මග ඵල

ප්‍රදානය කරති. ඇතැම් ආයතන තුළ බොහෝ කාලයක් භාවනා කළ පුද්ගලයින්ගෙන් අවුරුදු 60-70 වයස් සීමාවේ පසුවන පුද්ගලයින් තෝරාගෙන ඔවුන් ලිඛිත පරීක්ෂණයකට යොමු කොට එයින් සමත් වීම පදනම් කරගෙන සහතික නිකුත් කරති.

මෙසේ සහතික ලබන බොහෝ දෙනෙකුට අත්වන ඉරණම ශෝචනීය වේ. අනර්ථකාරී වේ. අඥාන ශ්‍රාවකයා තමන් ධ්‍යාන ලාභියෙක් යැයි සිතාගෙන මුලාවට පත් වී තමන්ට සිදුකළ හැකි වීර්යය උත්සහහය අතහැර දමා එම සිතුවිල්ලෙන් ම සිටිමින් හිස් අතින් කළුරිය කොට අපායගාමී වීම පළමුවෙනි අනර්ථයයි. එසේම තමා සේම තවත් බොහෝ දෙනෙක් ධ්‍යානලාභීන් බවට පත් වී ඇති බව සිතා තමන්ට එම තත්ත්වය ලබාදුන් ආචාර්යවරයා ද ස්වභාවයෙන් ම ඉහළ මග ඵල ලාභියෙක් යැයි කල්පනා කොට කාලය ගෙවති. මෙවැනි වංචාකාර සිතුවිලිවලින් ගහනව සිටින ඔවුන් මෙළොවදීම උන්මත්තකයින් බවට පත් වේ. පැවිද්දන්ට සිදුවන්නේ තමන් විසින් සිදු කරන ආධ්‍යාත්මික වංචාව හේතුවෙන් තමාගේ උපසම්පදා ශීලය බිඳ වැටීමත් එයින් භික්ෂුත්වයෙන් පිරිහීමත් සිදුවේ.

බුද්ධ දේශිත ''ආර්ය අෂ්ඨාංගික මාර්ගය ලෝකයේ පවතින තාක්කල් ලෝකයේ රහතුන්ගෙන් හිස් නොවේ'' යන්න පදනම් කරගෙන ඇතැම්විට මග ඵල ලාභීන් සිටිය හැක. නමුත් ඉහතින් සඳහන් කළ තැන තැන බිහිවන භාවනා ආයතන පසුපස අයාලේ යන අනවබෝධිත ශ්‍රාවකයින් තුළින් මෙම උසස් මනුස්ස ධර්මය බලාපොරොත්තු විය නොහැකිය. මන්දයත් එවැනි ශ්‍රාවකයින් භාවනාව උපාදාන කරගෙන සිටින බැවිනි.

## 2. හේතුඵල ධර්මය අවබෝධ කර නොගැනීම

බුදු කෙනෙක් ලොව පහළ වන්නේ අහම්බෙන් නොවේ. කාලාන්තරයක් තිස්සේ දස පාරමිතාවන් සමතිස් ආකාරයකින් පූරණය කොට කාලය, දීපය, දේශය, කුලය, මව යන පංච මහා අංගයන් සම්පූර්ණයෙන් නිරීක්ෂණය කිරීමෙන් පසුවය. පුද්ගලයාට අත්විඳින්නට සිදුවන දුක සැප මෙන්ම ලෝකයේ

සියලුම ක්‍රියාකාරීත්වයන් හරිහැටි අවබෝධ කර ගැනීමෙන් ලබන උතුම් ඥාණයක් උන්වහන්සේ තුළ පවති. ඒ අනුව මනුෂ්‍යයාට අත්විඳින්නට සිදුවන දුක සැප, දුබල බව, ඇඬීම, විලාප දීම, මරණයට පත්වීම ආදියට හේතුවන යමක් ඇති බවත් ඊට අනුව ඵලය සිදුවන බවත් මේ සියලු දේට හේතුව තෘෂ්ණාව බවත් තෘෂ්ණාව නැති කිරීමෙන් සියලු දුකින් මිදිය හැකි බවත් පැහැදිලිව පෙන්වා දී තිබේ. මෙම තත්ත්වය හුදෙක් තමන්ගේ ඇසීම් මාත්‍රයට පමණක් සීමා නොවී විඥ්ඥූ පුරුෂයා විසින් නුවණින් මෙනෙහි කොට පිළිගත යුතු දෙයක් බවත් ''පච්චත්තං වේදිතබ්බෝ විඥ්ඥූහීති'' යන ධර්ම පාඨයෙන් අවධාරණය කරයි. බුද්ධ දේශනාවට අනුව චතුරාර්ය සත්‍යය, පටිච්චසමුප්පාදය, ජාති ජරා මරණ ආදිය වනාහි බුදු කෙනෙකුන් ලොව පහළ වුවත් නොවූවත් සදාතනිකව පවතින්නකි.

''කතමොච භික්ඛවෙ පටිච්චසමුප්පාදො? ජාතිපච්චයා භික්ඛවෙ ජරාමරණං. උප්පාදා වා තථාගතානං අනුප්පාදාවා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා.''

බුදු කෙනෙකුන් ලොව පහළ වන්නේ මේ යථාර්ථය පෙන්වා දීමටය. පෙන්වා දුන් යථාර්ථය හරිහැටි නුවණින් නොදකින්නා සදාකල්හි සොයන්නට උත්සහ කරන්නේ තෘෂ්ණාධික වස්තූන්ය. තෘෂ්ණාව නිසා නැවත භවයක් ඇතිවන බව පෙන්වා දී ඇති මුත් ඒ පිළිබඳ අවබෝධයක් නොමැතිව ධර්මය තමා දන්නේය එබැවින් තමා බුදුන් විසින් දෙසූ මග ඵල සාක්ෂාත් කර ගත්තේය යනුවෙන් කල්පනා කරති. හේතුඵල න්‍යාය නුවණින් නොවිමසා, අවබෝධ නොකරගෙන ධර්මය එසේ සියල්ල දත් පුද්ගලයෙකු සේ හැසිරෙමින් අන් අය ද මුලාවට පත් කරමින් කාලය ගෙවන පුද්ගලයින් ද උසස් මිනිස් දම් පාරාජිකාව සිදු කර ගනී. ධර්මය දැනගත් පමණින් නිවන් අවබෝධ වන්නේ නැත. එසේනම් ඉහතින් සඳහන් කළ අන්දමට සියලු දේශනා දැනසිටි ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හිමියන් ප්‍රථමයෙන් ම මග ඵල ලාභියෙක් වියයුතුය. උන්වහන්සේ ධර්මය දැනසිටියා පමණි. අවබෝධ කරගත්තේ පසුවය. එසේනම් හේතුඵල න්‍යාය දැනගෙන විස්තර කිරීමට

කෙනෙකුට පුළුවන. එහෙත් අවබෝධය වනාහි දුෂ්කර කාර්යයිකි. වර්තමානයේ අන්ධ භක්තියෙන් යුත් ශ්‍රාවක පිරිස් සිතන්නේ ද මෙයමය. ''අපගේ ආචාර්යවරයා සෑම ධර්මයක් ම දනියි. ඕනෑම ප්‍රශ්නයකට ධර්මයෙන් උත්තර සපයයි. එවැනි දැනීමක් ඇති ඔහු අනිවාර්යයෙන් මාර්ග ඵල ලාභියෙක් විය යුතුමය'' යනුවෙන් සිතා පුදසත්කාර වන්දනමාන කිරීමට පෙළඹෙයි. මෙය ද තමන්ගේ අනර්ථය පිණිස වන්නේය.

### 3. පරමාර්ථ හා ක්‍රියාවලිය වරද්දා ගැනීම

වර්තමාන මග ඵල ලාභින් යැයි ප්‍රචාරය කරන බොහෝ දෙනෙකුගේ යටි පරමාර්ථ හා ඒ සඳහා සිදුකරන ක්‍රියාවලීන් වැරදි සහගතය. ආනාපානසති භාවනාව වැඩීම බොහෝ ලෙඩ සුවපත් කිරීමට මෙන්ම පුද්ගල ප්‍රතිශක්තිකරණය ඇති කරලීමට හේතුවන බව වෛද්‍ය විද්‍යාව මගින් ද තහවුරු කරගෙන තිබේ. එසේම පිරිත් නූල පිරිත් පැන් බෝධි පූජා ආදි පුද චාරිත්‍රයන් තුළින් ද යම් සහනයක් පුද්ගලයාට ළඟා කර ගත හැකිය. ඇතමුන් සිදු කරන්නේ මේවායෙහි ආධාරයෙන්, එහෙත් එය නොපවසා ධ්‍යාන බලයෙන් ලෙඩ සුව කිරීමේ කාර්යයට යොමු වී තිබේ. සැබවින්ම ඔවුන් පවසන්නේ තමන් සතු ධ්‍යාන බලයකින් එය සුව කරන බවයි. මෙහි පරමාර්ථය ලාභාපේක්ෂාවයි. මේ සඳහා ඔවුන්ට අන්‍යාගමිකයින්ගේ වරප්‍රසාද හිමි වේ. බුදුදහම නැතිකිරීමේ අභිලාෂයෙන් කටයුතු කරන ඇතැම් විදේශ බලවේග ඒ සඳහා ආධාර උපකාර සිදු කරයි. ඔවුන් ඒවා ලබාගෙන ධර්මයේ සඳහන් ඇතැම් ප්‍රකාශ කරුණු වැරදි ලෙස අර්ථකථනය කරමින් අන් අයට වඩා දැනුමක් උසස් ඥාණයක් තමන් සතු වන බවට ප්‍රචාර යවයි. මෙවැනි කෙනෙක් පිළිබඳව අසන අන්ධභක්තියින් ද ඔවුන්ගේ වහසි බස් වලට රැවටී ප්‍රතිකර්ම කොතෙකුත් තිබුණත් ඒ කරා යොමු වෙති.

ධර්මයෙහි නියම තත්ත්වය ප්‍රකාශ නොකොට වෙනත් කරුණු මගින් විස්තර කරලීම සර්පයා වැරදි ආකාරයෙන් අල්ලා ගැනීමක් බඳු යැයි මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ දී බුදුරජුන් පෙන්වා දී තිබේ. එයින් සිදුවන්නේ මරණය හෝ මරණය සමාන වේදනාවකට පත් වීමය. එවැනි පුද්ගලයින් මේ ශාසනයේ

සිවුරු දැරීමටවත් සුදුසු නොවන බව එහි වැඩිදුරටත් සඳහන් වේ.

### 4. අන් අයගේ වර්ණනාවලට රැවටීම

පුද්ගලයාගේ බාහිර ස්වරූපයෙන් මග ඵල ලාභියෙක් යැයි කෙනෙකුට අර්ථකථනය කළ නොහැක. යම් දෙයක් අවබෝධ කරදෙනවිට එය සත්‍යවාදී දහම යැයි හඳුනාගන්නා පිරිස් ඒ වටා එක්රොක් වී එම පුද්ගලයා පිළිබඳ ප්‍රශංසාත්මකව කථාකරයි. ඇතැම්විට එම පුද්ගලයාගේ ගමන් විලාශය දැක මොහු යම් ධ්‍යානලාභියෙක් යැයි වටහා ගනියි. ඉන්පසු එම තැනැත්තාගේ ගමන ප්‍රසන්නය. ශරීරය පැහැපත්ය. වචන සුමිහිරිය. යනුවෙන් නොයෙක් විදියේ කරුණු දක්වයි. එය අසන දකින පුද්ගලයා තමන සතු නොවන ගුණාංග අන් අය දකිති. එබැවින් මෙලොව අන් යට වඩා තමන් උසස් කෙනෙක් යැයි කල්පනා කරයි. බුදුසමය තුළ ද මෙවැනි පුද්ගලයින් බොහෝ සෙයින් සිටියහ. බාහිය දාරුචීරය නැමැත්තා එවැන්නෙකි. අමුතු ස්වරූපයකින් සිටි තමා කෙරෙහි වැඳුම් පිදුම් කළ අවස්ථාවේ තමා ද මේ ලෝකයේ රහත් හෝ රහත් මාර්ගයට පිළිපන් කෙනෙක් හෝ වන බව සිතීය. වෙනදාට වඩා තව තවත් ප්‍රසන්න වීමට අන් අයට දර්ශනය වන මොහොතේ තමන් සතු නොවන මග ඵලයක් ආරෝපනය කර ගන්නට ඔහු සිතයි.

මෙවැනි පුද්ගලයින් වර්තමාන සමාජය තුළ කොතෙකුත් දැකිය හැකිය. සමාජය තුළ කැපී පෙනෙන එවැන්නන් රහසිගතව සිදුකරනු ලබන ක්‍රියාවන් ඔවුන් ලඟින් ඇසුරු කරන්නන් ාකාරව දනියි. මෙසේ පිරිස් වර්ධනය කරගත් ඇතැම් වර්තමාන පුද්ගලයින්ගේ එම ක්‍රියාවන් ප්‍රතික්ෂේප කළ පුද්ගලයින් ඔවුන් විවේචනය කරමින් ඉන් ඈත් වී ගිය අවස්ථා වාර්තා වේ. අවාසනාව වන්නේ අන්ධභක්තිකත්වයෙන් යුත් පිරිස් එවැනි පසුබිමක් තුළ වුවත් ඔවුන් වටා ඒකරාශි වී තව තවත් ඔවුන්ගේ බලය වැඩි කරලීමට කටයුතු කිරීමයි. එයින් සිදුවන්නේ තමන්ට කොතරම් බාධක ආවත් තමන් වටා පිරිසක් ඒකරාශී වී ඇති නිසා ස්වකීය බලය පිරිහීමක් නොවන බව වටහාගෙන කටයුතු කරමින් සිටියි.

මෑත ඉතිහාසය තුළ එවැනි රහත් පුද්ගලයෙක් පිළිබඳ රට

පුරා ප්‍රචලිත වී ගියේය. මුල් බුදුසමයට අනුව විමසා බැලීමේදී ගිහි කෙනෙක් රහත් වූයේ නම් ඔහු පඤ්චස්කන්ධය දරාගෙන සිටින පුද්ගලයෙක් විය නොහැකිය. උදාහරණ ලෙස බාහිය දාරුචීරිය කථා පුවත පෙන්වා දිය හැකිය. බාහියට ගැඹුරු දේශනාවක් එමෙන්ම කෙටි දේශනාවක් සිදු කොට බුදුරජුන් වඩම කළහ. දෙසූ දහම පිළිබඳ මෙනෙහි කළ බාහිය වහා ධර්මය අවබෝධ කරගෙන රහත් විය. ඒ අවස්ථාවේ තුන් සිවුරක් ලබා පැවිදි වීමට අවස්ථාවක් නොතිබූ බැවින් ආපසු යාමට හැරුණු අවස්ථාවේ අලුත උපන් පැටියෙකු ඇති වැස්සියක විසින් අනින ලද්දේ මරණයට පත්විය. බුදුරජුන් නැවත වඩින අවස්ථාවේ ඔහුගේ දේහය දැක රහතන් වහන්සේලාට පවසන්නේ ඔහු වෙනුවෙන් චිතකයක් කරන ලෙසය.ඒ රහතන් වහන්සේ කෙනෙක් වූ නිසාය. මේ නයින් බලන කල ගිහි පාර්ශ්වයේ කෙනෙක් එවැනි උතුම් තත්ත්වයකට පත්වුවහොත් මේ ශරීරය දරාගෙන සිටිය නොහැක. මෑත භාගයේ පහළ වූ එකී ගිහි පුද්ගලයා රහත් යැයි කියමින් විවිධ ස්ථාන කරා යොමු වී ලෙඩ සුවකිරීම, ධර්මය දේශනා කිරීම වැනි ක්‍රියාවන් සිදු කොට ඇත. මෙම සිද්ධිය පමණක් නොව මෙවැනි පිරිස් ප්‍රමාණයෙන් බොහෝමයකි. එ පිළිබඳ වගකිවය යුතු තැන්වලට විශාල වශයෙන් වාර්තා වී ඇත.

ගිහියන්ට උත්තරිමනුස්ස ධම්ම පාරාජිකාව අදාළ නොවුණත් ඇතැම් විට ගිහි ජනතාව අතර සිටින උපාසක උපසිකාවන් සම්බන්ධයෙන් ද සමාජය තුළින් ම ගොඩ නැගුණු සංකල්ප මත ඔවුන් ද මග ඵල ලාභීන් යැයි සිතා කටයුතු කළ පිරිස් පිළිබඳ වාර්තා වෙයි. යම් භාවනා මධ්‍යස්ථානයකට ගොස් බොහෝ කාලයක් භාවනානුයෝගීව සිට සොවාන් සහතික ලබාගෙන නැවත ගමට එයි. ගමට එන ඇයගේ ගමන් විලාශය කථාබහ, ඇවතුම් පැවතුම් වෙනදාට වඩා වෙනස්ය. අසල්වාසීන් ඇය පිළිබඳ ගොඩ නගා ගන්නා ආකල්පය ද වෙනස් වේ. එවිට ඇය අන් අයට වඩා තමා වෙනස් නිසා ලබාගත් සහතිකය සැබවින්ම නිරවද්‍ය යැයි සිතයි.

## 5. භාෂාව නොදන්නාකම

පාලි භාෂාවේ ඇති බොහෝ වචනවලට සිංහල භාෂාවෙන් නව අර්ථකථන දෙමින් කටයුතු කිරීම තුළින් ද උතුරුමිනිස්දම් ගුණය ආරෝපණය කර ගනී. උදාහරණ ලෙස වේදනා යන වචනයේ තේරුම වේදනාවයි. මුල් බුදුසමයට අනුව එය සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යනුවෙනි තෙයාකාරය. ඒ පිළිබඳව අනවබෝධිත යෝගීන් වේදනා මෙනෙහි කරන්න යැයි උපදෙස් ලැබුණු විට ඒ අය මෙනෙහි කරන්නේ තුන් ආකාර වේදනාවන්ගෙන් එකක් පමණි. දුක නැතිකරීම නිවන් මාර්ගය යැයි දේශනා කර ඇති බැවින් එය පමණක් සිතා දුක නැති කරීමට උත්සහ ගනියි. එහෙත් දුක පමණක් නොව සාංසාරික සැප ද සංසාරික අදුක්ඛමසුඛය ද අත්හළ යුතුය. මෙසේ දුක පමණක් නැති කොට තමන් දුක නැති කිරීමෙන් ලැබූ මග ඵලයක් පිළිබඳ අන් අයට කරුණු වටහා දීමට උත්සහ ගනි. එසේ සිදු කිරීමෙන් ඔවුන් වඩන භාවනාව ද සම්පූර්ණ නොවේ. රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයේ රූප යන්නෙන් අදහස් කරන්නේ ඇසට පෙනෙන රූප පමණක් නොව ශබ්ද ගන්ධ රස ස්ඵර්ශ මන යන සය ආකාර වූ රූපස්කන්ධය වරදවා වටහාගෙන ඇසට පෙනෙන රූපය පමණක් මෙනෙහි කිරීමෙන් භාවනාව ද අසම්පූර්ණ කරගනි. එයින් මග ඵලයක් ගබා යම් අවබෝධයක්වත් ඔවුන්ට නොලැබෙයි. මෙසේ නූගත් ජනයා භාෂාවේ අදහස් පටලවා ගැනීමෙන් මග ඵලලාභීන් යැයි සමාජගත කරන්නට උත්සහ ගනියි.

### යෝජනා

ඉහතින් සඳහන් වූ පුද්ගලයින් පිළිබඳ වාර්තාවන විට මේ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග බොහෝමයක් ඇත. මූලික වශයෙන් ඒ ඒ පුද්ගලයින් අයත් වන පාර්ශ්වයන් ඇත. එහිදී මූලික වශයෙන් මේ පිළිබඳව සොයා බලා නිසි ආකාර තීන්දු තීරණ ඔවුන් වෙනුවෙන් ගතයුතුය. නැතහොත් ඔවුන් තමන් දරන මතයේ සිටිමින් වැරදි දෙයක් සමාජගත කරයි. නියම පරිදි ධර්මය කියා දෙන කෙනෙක්

කෙරෙහි ඔවුන් යොමුකළ යුතුය. පාර්ශ්ව දැනුවත් වීමෙන් පසු ගනු ලබන තීරණ වගකිව යුතු පාර්ශවයන් වන රජය මගින් ද මොවුන්ට නිසි දඬුවම් ලබා දිය යුතුය. උතුම් මිනිස් ධර්මයන් ඉක්මවීම සාසනයෙන් නෙරපා දැමීමට බලය සෑම වගකිවයුතු පාර්ශ්වයකටම තිබිය යුතුය. එවැන්නක් තිබුණත් වර්තමානයේ ඒ සඳහා නීතිගත කර ඇති බලයක් ලැබී නොමැති හෙයින් ඒ සඳහා වන බලය ලැබිය යුතුය.

උත්තරිමනුස්සධම්ම යන ශික්‍ෂාපදය ගිහියන්ට අදාළ නොවුණත් ඔවුන් විසින් සිදුකරන මෙවැනි දේ සම්බන්ධයෙන් පොදු නීතිය යටතේ දඬුවම් පැමිණවීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

දැන උගත් යැයි සම්මත ප්‍රවීණයන් සිටින විශේෂයෙන් බෞද්ධ අධ්‍යාපන ආයතන මගින් මේ පිළිබඳ කරුණු වටහා දීමෙන් පුද්ගලයින් නිසි මගට යොමු කළ යුතුය.

මේ ආකාරයට වර්තමාන සමාජය තුළ උතුම් මිනිස් දහම පිළිබඳ විවිධ අදහස් දරන විවිධ ක්‍රියාකාරකම් සිදුකරන පිරිස් බොහෝ සෙයින් දැකගත හැකිය. ඔවුන්ට එවැනි පසුබිමක් ගොඩ නැගීමට හේතුවන කරුණු කිහිපයක් මෙහි දී සාකච්ඡා වී ඇත. ඒ සියලු කරුණු හා ඒවාට නිසියාකාර ප්‍රතික්‍රියා සිදුකිරීමෙන් මෙවැනි අදහස් දරන අයට සත්‍ය වූ ධර්මය කුමක්දැයි අවබෝධ කරලීමට හැකි බව කිව හැකිය.

## ආන්තික සටහන්

1. ''යතො ඛො ආවුසො අරියසාවකො එවං අකුසලං පජානාති. එවං අකුසලමූලං පජානාති. එවං කුසලං පජානාති. එවං කුසලමූලං පජානාති. සො සබ්බසො රාගානුසයං පහාය පටිඝානුසයං පටිවිනොදෙත්වා අස්මීති දිට්ඨිමානානුසයං සමූහනිත්වා අවිජ්ජං පහාය විජ්ජං උප්පාදෙත්වා දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්ස අන්තකරො හොති. එත්තාවතාපි ඛො ආවුසො අරියසාවකො සම්මාදිට්ඨී හොති. උජුගතාස්ස දිට්ඨී. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො ආගතො ඉමං සද්ධම්මන්ති.'' *මජ්ඣිම නිකාය I,* සම්මාදිට්ඨි සුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, 112 පිටුව.
2. ''නාහං භික්ඛවෙ ආදිකෙනෙව අඤ්ඤාරාධනං වදාමි. අපි ච භික්ඛවෙ

අනුපුබ්බසික්ඛා අනුපුබ්බකිරියා අනුපුබ්බපටිපදා අඤ්ඤාරාධනං හොති.'' *මජ්ඣිම නිකාය II,* කීටාගිරි සුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, 246 පිටුව.

3. ''අත්ථි ඛො මහාලි මග්ගෝ, අත්ථි ඛො පටිපදා එතෙසං ධම්මානං සච්චිකිරියාය. අයමෙව අරියො අට්ඨංගිකො මග්ගෝ. අයං ඛො මහාලී මග්ගො අයං පටිපදා එතේසං ධම්මානං සච්චිකිරියාය.'' *දීඝනිකාය III,* මහාලි සුත්තං,
4. ''අච්ඡරියං භන්තේ අබ්භුතං භන්තෙ යාව ගම්භීරොචායං භන්තේ පටිච්චසමුප්පාදො ගම්භිරාවභාසො ච. අථ ච පන මෙ භන්තෙ උත්තානකුත්තානකො විය ඛායති'' *දීඝනිකාය III,* මහානිදාන සුත්තං,
5. ''මා හෙවං ආනන්ද අවච, මා හෙවං ආනන්ද අවච ගම්භීරොචායං පටිච්චසමුප්පාදො ගම්භීරාවභාසො ච. එතස්ස පන ධම්මස්ස අනනුබෝධා අප්පටිවේධා එව මයං පජා තන්තාකුලකජාතා ගුළාගුණ්ඩික ජාතා මුඤ්ජබබ්බජරූපා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාත්වත්තන්ති'' *දීඝනිකාය III,* මහානිදාන සුත්තං,
6. දස ඉමානි භික්ඛවෙ සංයොජනානි, කතමානි දස? පඤ්චොරම්භාගියානි සංයොජනානි. පඤ්ච උද්ධම්භාගියානි සංයොජනානි. කතමානි පඤ්චොරම්භාගියානි සංයොජනානි? සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො, කාමච්ඡන්දො, ව්‍යාපාදො. ඉමානි පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ඡ, අවිජ්ජාති. *අංගුත්තර නිකාය,* දසක නිපාත, සංයොජන සුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, 32 පිටුව.
7. පාරාජිකා පාළි, පාරාජිකකණ්ඩං, බු. ජ. මු. නැදිමාල, 2005, 198 පිටුව.
8. ඤාණසීහ හිමි, රඹුකේවෙල, භික්ෂු ප්‍රාතිමෝක්ෂය, යෙං කුවාන් බෞද්ධ අධ්‍යාපන ආයතනය, 2007.
9. *පාරාජිකාපාළි,* පාරාජිකඛණ්ඩො, චතුත්ථපාරාජිකං, බු. ජ. මු. නැදිමාල, 2005, 194-198 පිටු.
10. අනභිජානන්ති අසන්තං අභූතං අසංවිජ්ජමානං අජානන්තො අපස්සන්තො අත්තනි කුසලං ධම්මං අත්ථි මෙ කුසලො ධම්මොති. *-එම-*, බු. ජ. මු. නැදිමාල, 2005, 200 පිටුව.
11. උත්තරිමනුස්සධම්මො නාමඃ ඣානං, විමොක්ඛං, සමාධි, සමාපත්ති, ඤාණදස්සනං, මග්ගභාවනා, ඵලසච්ඡිකිරියා, කිලෙසප්පහානං, විනීවරණතා, චිත්තස්ස සුඤ්ඤාගාරෙ අභිරති. *-එම-*, බු. ජ. මු. නැදිමාල, 2005, 200 පිටුව.
12. උත්තුපනායිකන්ති තෙ වා කුසලෙ ධම්මෙ අත්තනි උපනෙති. අත්තානං වා තෙසු කුසලෙසු ධම්මෙසු උපනෙති. *-එම-* බු. ජ. මු. නැදිමාල, 2005, 200 පිටුව.
13. ඤාණන්ති තිස්සො විජ්ජා, දස්සනංන්ති යං ඤාණං තං දස්සනං. යං දස්සනං තං ඤාණං. *-එම-*, බු. ජ. මු. නැදිමාල, 2005, 200 පිටුව.

14. *චුල්ලවග්ගපාළි*, බුද්දකවත්ථුක්ඛන්ධකං, බු. ජ. මු. නැදිමාල, 2005, 250 පිටුව.

15. *සංයුත්තනිකාය*, නිදාන සංයුත්තය, පච්චය සුත්තං, බු. ජ. මු. නැදිමාල, 2005, 184 පිටුව.